**වර්ෂ 2025 ක් වූ ජූලි මස 18 වන දින පෙ.ව. 10.00ට ප්‍රාදේශීය සභා**
**රැස්වීම් ශාලාවේදී පවත්වන ලද**
**<u>මතුගම ප්‍රාදේශීය සභාවේ විශේෂ සභා රැස්වීමේ වාර්තාව</u>**

**සහභාගිත්වය -:සභිකවරු**

01. කසුන් මුණසිංහ මහතා - ගරු සභාපති
02. අනගිපුර සමන්ත රෝහණ මහතා - ගරු උප සභාපති
03. ලෙව්වන්දුව ලියනගේ මෙරිල් මුණසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
04. තුඩුගලගේ දොන් රෝහිත මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
05. අයි.එච්.ඩී. ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
06. අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
07. පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි - ගරු ප්‍රාදේශීය සභා සභික
08. චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා සභික
09. සංජේ එරංග කරවිට මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
10. ඩබ්.කේ. සුනෙත් ප්‍රියංකර මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
11. ජේ.ඒ. දර්ශන ශ්‍රී සම්පත් මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
12. රසික දූලන්ත වික්‍රමනායක මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
13. විතානගේ දොන් නිශාන්ත මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
14. බී.ඒ. අමිල ගයාන් මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
15. පී.ඩී. අමන් ප්‍රසාද් වික්‍රමසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
16. වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
17. එම්. ජගත් විමලසිරි මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
18. ලියනගුරුගේ ලාල් රංජිත් සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
19. ඒ. සුජිත් කුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
20. ගංවාරි සනත් සංජීව මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
21. ලියනගේ දොන් චන්ද්‍රදාස මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
22. ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා සභික
23. මාවතගේ ගාමිණී සිසිර කුලරත්න මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
24. ඩී.ඩබ්. උභයනන්ද පද්මලාල් මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
25. කළුගල හේවාගේ ගාමිණී මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
26. තොටගමගේ නිහාල් මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
27. ටී. විජිතා දර්ශනී කුමාරි ද සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික
28. කේ.ඒ.ඩී. තිළිණි මධුෂානි සිරිවර්ධන මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා සභික
29. කේ.කේ. කාවින්ද්‍යා ඉඳුවරනි මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා සභික
30. චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා සභික
31. ආර්.එම්. රුවන්ති වාසනා රත්නායක මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා සභික
32. ඩබ්.ඒ. ඔෂධි ධනංජනා මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා සභික
33. දොන් සීමන් රාලලාගේ දුමිඳු චතුර සම්පත් මහතා - ගරු ප්‍රාදේශීය සභා සභික

**නිලධාරීන්**

01 නෙලූ නිශාන්ති ඉද්දගොඩ මහත්මිය - ලේකම්
02 ඩබ්.ඩබ්.ජී.එල්. ප්‍රනාන්දු මහත්මිය - කළමනාකරණ සේවා නිලධාරි (සභා)

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**01 යෝජනාව**

මතුගම ප්‍රාදේශීය සභාවේ ලේකම්වරිය ලෙස කටයුතු කරන පරිපාලන නිලධාරි නෙලු නිශාන්ති ඉද්දගොඩ මහත්මිය සභාවේ ලේකම් වශයෙන් පිළිගැනිමට සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා සභික සංජේ එරංග කරවිට මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

සභාවේ යෝජනාවක් විදිහට මෙය ඉදිරිපත් කළත් මේ වන විටත් සභාවේ ලේකම්වරිය ලෙස රාජකාරි කටයුතු කරන බැවින්, මෙම යෝජනාව ඉදිරිපත් කිරිම අත්‍යවශ්‍ය නොවේ. එබැවින් ඉදිරියට කටයුතු කරගෙන යාම තමයි අප කළයුතු වන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මෙම යෝජනාව ඒකමතික ස්ථිර කරන බව පැවසුවද අපි එයට එකඟ වන්නේ නැහැ. දැනටත් මෙතුමිය සභාවේ ලේකම්තුමියයි. එතුමියගේ පත්විම් බලධාරියා අප නොවෙයි ඇයගේ පත්විම් බලධාරියා පළාත් පාලන කොමසාරිස්වරයායි. මෙම යෝජනාව සභාවට ඉදිරිපත් කළයුතු එකක් නොවන බැවින් මෙම යෝජනාව මෙම න්‍යාය පත්‍රයෙන් ඉවත් කළයුතු බව අප පවසා සිටිනවා. න්‍යාය පත්‍රයෙන් ඉවත් නොකරන්නේ නම් අපට මෙම යෝජනාව සම්බන්ධව එකඟතාවය පළ කිරිමට නොහැක.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මෙම යෝජනාව ඉල්ලා අස්කර ගැනිමට මා තීරණය කරමි.

**02 යෝජනාව**

2025 ජූලි මස සිට 2025.12.31 දක්වා මාසික මහ සභා පැවැත්විමේ දිනයන් ලෙස පහත දිනයන් සභාවට යෝජනා කරමි.

- 2025 ජූලි 29
- 2025 අගෝස්තු 12
- 2025 සැප්තැම්බර් 09
- 2025 ඔක්තෝබර් 14
- 2025 නොවැම්බර් 11
- 2025 දෙසැම්බර් 09

ගරු ප්‍රාදේශීය සභා සභික තුඩුගලගේ දොන් රෝහිත මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභික ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මෙම යෝජනාව සම්බන්ධව මා එකඟයි. නමුත් රටේ හදිසි තත්ත්වයක් උද්ගත වුවහොත් රට වැසිමක්, හදිසි ඇදිරිනිතියක් ඇතිවුවහොත් එවැනි අවස්ථාවක ගන්නා පියවර කුමක්ද යන්න මෙම

යෝජනාව අඩුපාඩු සහිත යෝජනාවක් බැවින් එළඹෙන පළමු වැඩ කරන දිනයක් එම මාසයේ සභාව පවත්වන දිනය ලෙස මෙම යෝජනාවට එකතු කිරිම සුදුසුයි.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

ඉදිරිපත් කරන ලද කරුණු සලකා බලා මවිසින් මෙම යෝජනාව සංශෝධනය කර ඉදිරිපත් කරමි.

- **ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා විසින් සංශෝධිත යෝජනාව**

  2025 ජූලි මස සිට 2025.12.31 දක්වා මාසික මහ සභා පැවැත්වීමේ දිනයන්( **සාධාරණ හේතුවක් මත මෙම දින සභාව පැවැත්වීමට නොහැකි වුවහොත් ඊළඟ වැඩ කරන දිනය සභාව පැවැත්වීමට යටත්ව,)** ලෙස පහත දිනයන් සභාවට යෝජනා කරමි.

  - 2025 ජූලි 29
  - 2025 අගෝස්තු 12
  - 2025 සැප්තැම්බර් 09
  - 2025 ඔක්තෝබර් 14
  - 2025 නොවැම්බර් 11
  - 2025 දෙසැම්බර් 09

ගරු ප්‍රාදේශීය සභා සභික තුඩුගලගේ දොන් රෝහිත මහතා විසින් මෙම සංශෝධිත යෝජනාව ස්ථිර කරන ලදී.

**තීරණය - ඒකමතිකව සහා සම්මත විය.**

**03 යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 216 වගන්තිය අනුව සභාවේ ලේකම් වෙත රු. 1.00 සිට රු. 50,000.00 දක්වා වියදම් දැරිම සඳහා අනුමත කිරිමට අධිකාරිය පැවරිමට සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභික ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

සභාපතිතුමාගේ මෙම යෝජනාවත් ඉතා ගෞරවයෙන් සංශෝධනයක් ඉදිරිපත් කරනවා රුපියල් 01.00 සිට රුපියල් 50,000.00 දක්වා වියදම් දැරිම සඳහා අපේ ලේකම්තුමියට අධිකාරි බලය පැවරිම සම්බන්ධව අපගේ විරුද්ධත්වයක් නැහැ. නමුත් මෙම කටයුතු සිදු විය යුත්තේ මහ සභාවේ ආවරණ අනුමැතියට යටත්ව එම වියදම් කිරිම සිදු කරලා ඊ ළඟට එළඹෙන මහ සභාවට එම වියදම් කිරිම සම්බන්ධව ඉදිරිපත් කරලා මහ සභාවේ සභා සම්මතයක් ලබා ගැනිමට යටත්ව මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා විසින් සංශෝධිත යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 216 වගන්තිය අනුව සභාවේ ලේකම් වෙත රු. 1.00 සිට රු. 50,000.00 දක්වා වියදම් දැරිම සඳහා අනුමත කිරිමට අධිකාරිය පැවරිමට (**වියදම් කර වාර්තාව සභාවට ඉදිරිපත් කිරිමට යටත්ව,)** සභාවට යෝජනා කරමි

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**තීරණය - ඒකමතිකව සභා සම්මත විය.**

**04 යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය අනුව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවක් පිහිටුවීමට සහ එහි කාර්යයන් පහත පරිදි විය යුතු යැයි සභාවට යෝජනා කරමි.

1. මූල්‍ය සීමාව රු. 50,001.00 සිට රු. 1,000,000.00 දක්වා සභාවේ භාණ්ඩ වැඩ, සේවා හා තොරතුරු පද්ධති සැපයීම සඳහා වියදම් දැරීමට බලය දීම හා ගෙවීමටත්,
2. සභාවේ මූල්‍ය හා සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීමට සභාව වෙත නිර්දේශ ලබා දීම.
3. දැනට ආදායම් උත්පාදන ව්‍යාපෘති හා නව ආදායම් උත්පාදන ව්‍යාපෘති පිළිබඳව මහ සභාවට නිර්දේශ ලබා දීම.
4. ටෙන්ඩර් කමිටුවල හා ඇගයීම් කමිටුවල කාර්ය සාධනය පිළිබඳව සලකා බැලීම.

ගරු ප්‍රාදේශීය සභා සභික කළුගලගේ ගාමිණී මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභික ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මෙම යෝජනාවේ මූල්‍ය සීමාව රු. 50,001.00 සිට රු. 1000,000.00 දක්වා වියදම් දැරීමේ බලය මහ සභාවේ ආවරණ අනුමැතියට යටත්ව සම්මත කරන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික චමිලානි රුවන්දිකා ත්‍රීමාන්න මහත්මිය**

මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධව අදහස් සම්බන්ධ දැනගන්න කැමතියි. මෙහිදී සභාවට ගෙවීම් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගෙවීම් කිරීම සිදුකරවාද යන්න දැනගන්න කැමතියි.

**ගරු ප්‍රාදේශීය සභා සභික ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

ගෙවීම් සිදුකිරීමෙන් අනතුරුව සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගතයුතුයි යන්නයි මා යෝජනා කලේ.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

ඉදිරිපත් කරන ලද කරුණු සලකා බලා මවිසින් මෙම යෝජනාව සංශෝධනය කර ඉදිරිපත් කරමි.

- **ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා විසින් සංශෝධිත යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය අනුව මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවක් පිහිටුවීමට සහ එහි කාර්යයන් පහත පරිදි විය යුතු යැයි සභාවට යෝජනා කරමි.

1. මූල්‍ය සීමාව රු. 50,001.00 සිට රු. 1,000,000.00 දක්වා සභාවේ භාණ්ඩ වැඩ, සේවා හා තොරතුරු පද්ධති සැපයීම සඳහා වියදම් දැරීමට බලය දීම හා ගෙවීමටත්,
2. සභාවේ මූල්‍ය හා සම්බන්ධ ප්‍රතිපත්ති සකස් කිරීමට සභාව වෙත නිර්දේශ ලබා දීම.

3. දැනට ආදායම් උත්පාදන ව්‍යාපෘති හා නව ආදායම් උත්පාදන ව්‍යාපෘති පිළිබඳව මහ සභාවට නිර්දේශ ලබා දිම.

4. ටෙන්ඩර් කමිටුවල හා ඇගයීම් කමිටුවල කාර්ය සාධනය පිළිබඳව සලකා බැලීම.

**වියදම් කර වාර්තාවක් සහා ආවරණයට ඉදිරිපත් කිරිමට යටත්ව,**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනගිපුර සමන්ත රෝහණ මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී

**තීරණය - ඒකමතිකව සහා සම්මත විය.**

**05** **යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය අනුව **මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව** ලෙස පහත සාමාජිකයින්ගෙන් යුක්ත විය යුතු බව සභාවට යෝජනා කරමි.

1. කසුන් මුණසිංහ මහතා - ප්‍රා.ස. සභාපති - සභාපති
2. ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා - ප්‍රා.ස.ස. - සාමාජික
3. සංජේ එරංග කරවිට මහතා - ප්‍රා.ස.ස. - සාමාජික
4. තුඩුගලගේ දොන් රෝහිත මහතා - ප්‍රා.ස.ස. - සාමාජික
5. ලියනගුරුගේ ලාල් රංජිත් සිල්වා මහතා - ප්‍රා.ස.ස. - සාමාජික

ගරු ප්‍රාදේශීය සභා සභික ලියනගේ දොන් චන්ද්‍රදාස මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභික තොටගමගේ නිහාල් මහතා**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 184 වගන්තිය යටතේ මෙම යෝජනාව සඳහා සංශෝධන යෝජනාවක් ලෙස මෙම ප්‍රාදේශීය සභාව සඳහා මෙවර තේරි පත් වූ සියළු පක්ෂ නියෝජනය වන ලෙස සභිකයෙකු නම් කළ යුතු බව මා යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.සී.ආර්. දුමිඳු චතුර සම්පත් මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභික මෙරිල් මුණසිංහ මහතා**

මෙම යෝජනාව සම්බන්ධව අපගේ විරෝධතාවයක් නැහැ. සියළු පක්ෂ නියෝජනය විම නිසා ගැටළු අවම වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මෙතුමා ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් අපගේ විරෝධතාවයක් නැහැ නමුත් ගැටළුව තියෙන්නේ කමිටු සඳහා සාමාජිකයින් පත් කරන විට සෑම පක්ෂයක්ම නියෝජනය වන පරිදි පත් කිරිමට සුදානම් වනවා නම් මාලිමාවේ අපිට වැඩි නියෝජනයක් අවශ්‍ය වන බව ඒ මන්ද එකම එකම එක්කෙනා ජයග්‍රහණය කරලා ලැයිස්තුවෙන් ආව අයටත් අවස්ථාව ලැබෙනවා නම් 13 දෙනෙකුගෙන් යුත් මහජනතාවගේ නියෝජනයෙන් පත් වූ කණ්ඩායමට ලැබිලා තියෙන්නේ. එහෙම වුණොත් අපට ඉතාමත් අසාධාරණයක් වෙනවා. මේ කමිටු හැමදෙනාටම සාධාරණව බෙදෙන්න ඕන. ප්‍රාදේශීය සභා පනතේ විශේෂයෙන් සඳහන් කර නොමැති වුණාට මහ නගර සභා

ආඥා පනතේ සහභාගි වන කණ්ඩායම් දෙක නියෝජනය වන ස්ථානයක් ලෙස හදන්න ඕන යැයි සඳහන්ව ඇති බැවිනි. දැනට තිබෙන මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාවේ සාමාජිකයින් 5 දෙනාගෙන් යුතු කමිටුව සම්බන්ධ අපගේ විරුද්ධත්වයක් නැහැනමුත් මෙම සංශෝධන වලට යනවා නම් විශේෂයෙන්ම මාලිමාවේ අපට එක නියෝජිතත්වයකින් ඉදිරිපත් විය නොහැකි බව මම මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික තුඩුගලගේ දොන් රෝහිත මහතා**

මාලිමාවේ ලලිත් සිරිවර්ධන මන්ත්‍රීතුමා ගෙන ආ අදහසට අනුව 13න් දෙදෙකුගෙන් යුත් කණ්ඩායම සඳහා වැඩි නියෝජනයක් ලබා දිය යුතු බවයි. මම යෝජනා කරනවා අපිත් සමඟි ජන බලවේගය හැටියට අපිටත් 14 ක් මේ සභාවේ සිටියා අනෙක් පක්ෂත් අපට උදව් කලා එම නිසා මම යෝජනා කරනවා වැඩිපුර බලය අප ලඟ තබාගතයුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා සභික චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය**

ලලිත් සිරිවර්ධන මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව ට විරෝධතාවය ප්‍රකාශ කර සිටිනවා. ඔබතුමා ප්‍රකාශ කළ ආකාරයට 13 දෙනෙකුගේන් සමන්විත ඔබතුමාගේ කණ්ඩායමට කමිටුවල වැඩි නියෝජනයක් ලබා දිම සම්බන්දව ඉල්ලිම අනුව මේ වන විට ඔබතුමා දන්නවා මතුගම ප්‍රාදේශීය සභාවේ බලය ඔබතුමාලා සතුව නැහැ. බලය තිබෙන්නේ සමඟි ජන බලවේගය ප්‍රධාන ඒකාබද්ධ විපක්ෂයටයි. මම ඔබතුමාගෙන් ගෞරවයෙන් යුක්තව අහනවා මේ වෙලාවේ ඔබතුමාලා සතුව මේ බලය තිබුණා නම් ඔබතුමාලො මේ ඒකාබද්ධ විපක්ෂයට වැඩි නියෝජනයක් ලබා දෙනවාද. එම නිසා ඉතිහාසයේ සිට එන පිළිවෙල සභාවේ බලය හිමි කණ්ඩායම තමයි වැඩි නියෝජිතධූරයක් කමිටු වල දාන්නේ. ඔබතුමා දන්නවා 2018 දී ඔබතුමා මේ සභාව නියෝජනය කළ නමුත් මේ ආකාරයට ඉල්ලිම් කලේ නැහැ. ඒකාබද්ධ විපක්ෂයට වැඩි බහුතරය ඇති බැවින් සභාපතිතුමනි කමිටු පත් කිරිමේ දී වැඩි අවධානය යොමු කරන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මෙහිදි මම ප්‍රකාශ කලේ දැන් පවතින මුදල් හා ප්‍රතිපත්ත කාරක සභාව සම්බන්ධව විරුද්ධත්වයක් නොමැති බවයි. සියලු පක්ෂ සඳහා නියෝජනය ලැබෙනවා නම් අපට වැඩි නියෝජනයක් ලබාදෙන ලෙසයි මා පැවසුවේ.

**ගරු ප්‍රාදේශීය සභා සභික තොටගමගේ නිහාල් මහතා**

ලලිත් සිරිවර්ධන මන්ත්‍රිතුමා හා සමඟි ජන බලවේගය ප්‍රධාන ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රිතුමිය විසින් ඉදිරිපත් කළ යෝජනාව සාධාරණයි යන්න මා විශ්වාස කරනවා මම අදහස් කලේ මුදල් හා කාරක සභාවට සියලු පක්ෂ නියෝජනය වන පරිදි නම් විය යුතුයි යන්නයි මෙම සභාවේ 33 දෛනාම එකඟතාවෙය තියෙනවා නම් මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව පත්විමට එයත් සුදුසුයි යැයි මා සිතනවා. එවිට විනිවිධභාවයෙන් යුක්තව කටයුතු කිරිමට හැකියාව තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික මාවතගේ ගාමිණී සිසිර කුලරත්න මහතා**

මුදල් හා කාරක සභාව සඳහා පස්දෙනෙකුගෙන් (05) යුත් කමිටුව සුදුසු යැයි මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

සභාපතිතුමා, උප සභාපතිතුමා හැරුනාම අන් සියළු දෙනා සභිකයින් පුද්ගලික න්‍යාය පත්‍රානුකූලව අපි පක්ෂ වල බෙදුනට මේ පිළිබඳව ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමන්ලාගේ උපදෙස් ලබාගෙන වැඩ කටයුතු කරගෙන යමු. අනෙකුත් කමිටු සඳහා මේ සියළු පක්ෂ නියෝජනය වන පරිදි පත්කර තිබෙනවා කුමක් හෝ කමිටුවකට. එම නිසා මේ ආකාරයට වැඩ කටයුතු කරගෙන යමු.

**ගරු ප්‍රාදේශීය සභා සභික අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා**

සභාවේ ඉදිරි වැඩකටයුතු ඉදිරියට කරගෙන යාමයි අප කළයුතු වන්නේ ඒ අනුව යම් යෝජනාවක් ගෙන ආ විට ඒ සම්බන්ධ සියළු දෙනා සාකච්ඡා කර තීරණයක් ගන්න. ඡන්දයකට ගොස් හෝ තීරණයක් ගැනීමට සභාපතිතුමනි ඔබතුමාට බලය තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

අපි ඉතාමත් ගෞරවයෙන් කාරුණිකවයි මම කරන්නේ සංශෝධනයන්ට යටත්වයි මම කතා කලේ. මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව ගැන මගේ ගැටලුවක් නැහැ පක්ෂ සම්බන්ධ වෙන වෙනම සලකන්න අවශ්‍ය නැහැ මම ඒකට එකඟයි. සභාවේ ව්‍යවස්ථාව අනුව අපි සියළු දෙනා තනි තනි මන්ත්‍රිවරු ඔබතුමා සභාපති මෙතුමා උප සභාපති ඔබතුමා බලන්න කමිටු වලට දාලා තියෙන මන්ත්‍රීවරු කවුද කියලා එක මන්ත්‍රීවරයා දෙතැනක ඉන්නවා සමහර මන්ත්‍රිවරු ඔබතුමා දැකලම නැහැ. ඔබතුමා අවශ්‍ය නම් ඡන්දයකට වුවත් යන්න අපි ඒකට අකමැත්තක් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මන්ත්‍රීතුමාගේ අදහස් දැක්වීමට බොහෝම ස්තූතියි අපේ නිහාල් මන්ත්‍රීතුමා ගෙනා අදහස් ගොඩක් හොඳයි නමුත් මෙය ප්‍රායෝගිකය ඉටු කිරීමේ දී ගැටලු මතුවෙනවා. එම නිසා සංශෝධනයට යටත් නොවන විදිහට මේ ගෙනා යෝජනාව ඉදිරියට කරගෙන යමු. ලබන වර්ෂයේ නැවත සංශෝධනයක් සිද්ධ වෙනවා. එවිට අපි මේ පිළිබඳව සලකා බලා මන්ත්‍රීවරුන්ගේ අදහස් වලට ගැලපෙන පරිදි ඉදිරියට කරගෙන යන්න අවස්ථාව දෙන්නම්. සංශෝධනයකින් තොරව මෙම යෝජනාව බෙදීමක නොගිහින් සම්මත කර ගනිමු.

**ගරු ප්‍රාදේශීය සභා සභික තොටගමගේ නිහාල් මහතා**

මා ඉදිරිපත් කරන ලද සංශෝධනයට අදාලව මන්ත්‍රිවරුන් අදහස් පක්ෂව හා විපක්ෂව ඉදිරිපත් කළ බැවින් පක්ෂ විපක්ෂ ඡන්ද විමසීමක් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික ඩී.සී.ආර්. දුමිඳු චතුර සම්පත් මහතා**

සංශෝධන යෝජනාව මා විසින් ස්ථිර කරන ලද අතර එම යෝජනාව මවිසි කළ ස්ථිරත්වය ඉල්ලා අස්කර ගන්නා බව ප්‍රකාශ කර සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රසික දුලන්ත වික්‍රමනායක මහතා**

සභාපතිතුමනි ඔබතුමා ලබන වසරේ මෙම සංශෝධනය කරන බැවින් එඑසේ නම් බෙදීමක් නොමැතිව මෙය ස්ථිර කරලා ඉදිරියට යමු යැයි මා යෝජනා කරනවා. පස් දෙනෙකුගෙන් යුතු කමිටුව සභාගත කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික මෙරිල් මුණසිංහ මහතා**

මේ කමිටු යෝජනා කර තියෙන්නේ ආණ්ඩු පක්ෂයේ සියලු දෙනා හා අනෙකුත් පක්ෂ සාධාරණයක් කරලා තියෙන්නේ නිහාල් මන්ත්‍රීතුමා කියන ආකාරයට ගැටලුවක් වෙලා තියෙනවා එම පක්ෂය නියෝජනය වෙලා නැහැ දුමිදු සම්පත් මන්ත්‍රීතුමා නියෝජනය වෙලා නැහැ එම නිසා මේ සම්බන්ධව සාධාරණයක් කරමු. මම යෝජනා කරන්නේ මේ මාස හය සඳහා බෙදිලා වාද කරන්න ගියොත් අපට තියෙන කාලය අඩුවෙනවා වැඩ කරන්න එම නිසාා නම් කරන ලද පස්දෙනෙකුගෙන් යුත් මුදල් කමිටුව ඉදිරියට කරගෙන යමු. සියලු දෙනාට ඉදිරියේ දී මේ සම්බන්ධව පුහුණුවක් ලැබේවි මුදල් කමිටුව කියන්නේ ලොකු වගකිමක් තියෙන දෙයක් කොහොම වුණත් මෙය මහ සභාවට ඉදිරිපත් කරන්න ඕන.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මෙම යෝජනාව සම්බන්ධව බෙදීමකට යාමට අවශ්‍ය නොවේ එම සංශෝධන යෝජනාව ස්ථිර කළ දුමිදු චතුර සම්පත් මන්ත්‍රීතුමා එම යෝජනාව ස්ථිර කිරිම ඉල්ලා අස්කර ගතයුතු බැවින් මා විසින් ඉදිරිපත් කළ යුතු යෝජනාව සම්මත කිරිමට නොහැකි බව ප්‍රකාශ කරන ලදී.

සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනාව සභා සම්මත විම

**තීරණය - ඒකමතිකව සභා සම්මත විය.**

**06 යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය අනුව **නිවාස හා ප්‍රජා සංවර්ධන හා පරිසර කාරක සභාවක්** පිහිටුවිමට සහ එහි කාර්යයන් පහත පරිදි විය යුතු යැයි සභාවට යෝජනා කරමි.

1. නගරයේ අනවසර ඉදිකිරිම් සම්බන්ධව කටයුතු කිරිම සඳහා මහ සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරිම.
2. බල ප්‍රදේශයේ පරිසර ගැටලු සම්බන්ධ නෛතික ක්‍රියාමාර්ග ගැනිම සඳහා මහ සභාවට අවශ්‍ය නිර්දේශයන් ලබා දිම.
3. ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම, ගැටළු සම්බන්ධ ක්‍රියාකිරිම සඳහා මහ සභාවට අවශ්‍ය නිර්දේශයන් ලබා දිම.

ගරු ප්‍රාදේශීය සභා සභික අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**තීරණය - ඒකමතිකව සභා සම්මත විය.**

**07 යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය අනුව **නිවාස හා ප්‍රජා සංවර්ධන හා පරිසර කාරක සභාව** ලෙස පහත සාමාජිකයින්ගෙන් යුක්ත විය යුතු බව සභාවට යෝජනා කරමි

1. කසුන් මුණසිංහ මහතා - ප්‍රා.ස. සභාපති - සභාපති
2. අනගිපුර සමන්ත රෝහණ මහාතා -ප්‍රා.ස.ස. - සාමාජික
3. චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය - ප්‍රා.ස.ස- සාමාජික
4. අමන් ප්‍රසාද් වික්‍රමසිංහ මහතා - ප්‍රා.ස.ස. - සාමාජික
5. චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය - ප්‍රා.ස.ස - සාමාජික
6. ඩබ්.ඒ. ඔෂධි ධනංජනා මහත්මිය - ප්‍රා.ස.ස - සාමාජික
7. රසික දුලන්ත වික්‍රමනායක මහතා - ප්‍රා.ස.ස. - සාමාජික
8. කේ.කේ. කාවිද්‍යා ඉඳුවරනි මහත්මිය -ප්‍රා.ස.ස. - සාමාජික
9. තොටගමගේ නිහාල් මහතා - ප්‍රා.ස.ස. - සාමාජික

ගරු ප්‍රාදේශීය සභා සභික තුඩුගලගේ දොන් රෝහිත මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභික ජගත් විමලසිරි මහතා**

මුදල් හා ප්‍රතිපත්ති කාරක සභාව සම්මත වුණා ඒ ආකාරයෙන්ම මෙම කමිටු ස්ථිර වුවායින් පසුව මේ සම්බන්ධව අදහස් දක්වන්න අවස්ථාව තියෙනවාද?

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

යෝජනා ස්ථිර කිරිමෙන් අනතුරුව ඒ සම්බන්දව නැවත වාරයක් සංශෝධන ඉදිරිපත් කිරිමට හැකියාවක් නැහැ. සංශෝධන තිබේ නම් ලබන වර් ෂයේ කමිටු සඳහා තමයි සංශෝධන ඉදිරිපත් කිරිමට හැකියාව ලැබෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා සභික ජගත් විමලසිරි මහතා**

මන්ත්‍රීවරුන් 33ක් සිටින සභාවේ මන්ත්‍රිවරුන් 23න් දෙනෙකුට විතරයි කමිටටු සඳහා අවස්ථාව ලබා දි තිබෙන්නේ. මන්ත්‍රීවරුන් 33ක් ඉන්නවා මගේ යෝජනාවක් තියෙනවා සභාපතිතුමාට අවස්ථා 5කුත්, උප සභාපතිතුමාට අවස්ථා 2 හෝ 3ක් ලබා දිලා අන් සියලු අවස්ථා ඉතිරි සියළු දෙනාට ලබාදිම මගින් ඉදිරි කමිටු සකස් කිරිමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික සංජේ එරංග කරවිට මහතා**

කමිටු සඳහා සාමාජිකත්වය ලබාදුන් ආකාරය සැලකිල්ලටට ගෙන කටයුුතු කරපු ආකාරය මා දන්නා කරුණක් ජාතික ජන බලවේගයේ කණ්ඩායම් නායක ලලිත් සිරිවර් ධන මහතා සමඟ දුරකතනයෙන් සාකච්ඡා කර මෙම කමිටු වලට පත්කර ඇත.

දර්ශන් ශ්‍රී සම්පත් මහතා හා දුමිදු චතුර යන දෙදෙනාගේ නම් දෙක මාරු වී ඇති බැවින් එය සංශෝධනය කිරිමක් නොකර සකස් කිරිමට සභාපතිතුමා සාකච්ඡා කර ගන්නා ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභික ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

සභාපතිතුමා ඔබතුමා මගෙන් නම් ඉල්ලුවා ඒක ඇත්ත ඒ බව අපේ පක්ෂයේ සාමාජිකයින් දන්නවා. නමුුත් මෙම කමිටු සඳහා නම් 9ක් යෝජනා කිරිම සම්බන්ධව මම දැනුවත් නැහැ එ් යෝජනාවට කැමැත්තක් නැහැ. අපේ නවක මන්ත්‍රිවරුන්ට ආදර් ශයක් වනන පරිදි කටයුතු කල යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා සභික මෙරිල් මුණසිංහ මහතා**

නව කමිටු ු දෙකක් වැඩි කිරිමට යෝජනා කරනවා පරිසර කමිටුව, ප්‍රජා සංවර්ධන කමිටුව, මහජන පෙත්සම් කමිටුව ලෙස කමිටු 07ක් පත්කරමු. කමිටුවකට සාමාජිකයින් 5ක් ලෙෙස පත්කර ඔක්කෝම සාමාජිකයින් 35ක් සඳහා අවස්ථාව ලබා ා දිමට කටයුතු කරමු.

**ගරු ප්‍රාදේශීය සභා සභික ජගත් විමලසිරි මහතා**

මෙම යෝජනාව ස්ථිර කරනවා එවිට සියලුම මන්ත්‍රිවරුන්ට කමිටු සාමාජිකත්වය ලබාදිමට හැකියාවක් ලැබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ අදහස් දක්වන්න අවස්ථාවක් මිස යෝජනා ස්ථිර කරන අවස්ථාවක් නොවන බැවින් අප මෙම මාස 06 ක් සඳහා පමණයි මෙම කමිටු ටික පත්කරනු ලබන්නේ ඉදිරි වර් ෂය සඳහා සංශෝධන සිදුකර පත්කිරිමට බලාපොරොත්තු වෙනවා. එම නිසා අපි ඊලඟ අවුරුද්දේ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර මෙම කමිටු පත් කිරිමට කටයුතු කරමු.

**ගරු ප්‍රාදේශීය සභා සභික තොටගමගේ නිහාල් මහතා**

මෙම ප්‍රාදේශීය සභාවේ රිති අනුව මෙහි සිටින සියලූ සාමාජිකයෙකුට ඕනෑම කාරක සභාව නියෝජනය කිරිම හැකියාවක් තියෙනවා. එබැවින් කමිටු දෙකක සාමාජිකත්වය දැරිමට අයිතියක් නැහැ. එම නිසා ඕනෑම සාමාජිකයෙකුට කුමන හෝ කමිටුවක සාමාජිකත්ව දැරිමට අයිතියක් තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා**

නිහාල් මන්ත්‍රීතුමන්ට කමිටු වලට එකතුවිමට අවශ්‍ය නම් ඉල්ලීමක් කර කමිටු වලට එකතු වන ලෙස මම ප්‍රකාශ කරනවා

**තීරණය - ඒකමතිකව සහා සම්මත විය.**

**08** **යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය අනුව **කාර්මික සේවා කාරක සභාවක්** පිහිටුවිමට කාර්යයන් පහත පරිදි සභාවට යෝජනා කරමි.

1. සභාවේ කර්මාන්ත පිළිබඳව මහ සභාවට නිර්දේශ ඉදිරිපත් කිරිම.

ගරු ප්‍රාදේශීය සභා සභික මාවතගේ ගාමිණී සිසිර කුලරත්න මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**තීරණය - ඒකමතිකව සහා සම්මත විය.**

09 **යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය අනුව **කාර්මික සේවා කාරක සභාව** ලෙස පහත සාමාජිකයින්ගෙන් යුක්ත විය යුතු බව සභාවට යෝජනා කරමි.

1. කසුන් මුණසිංහ මහතා - ප්‍රා.ස. සභාපති - සභාපති

2. මෙරිල් මුණසිංහ මහතා - ප්‍රා.ස.ස. - සාමාජික
3. මාවතගේ ගාමිණී සිසිර කුලරත්න මහතා - ප්‍රා.ස.ස. - සාමාජික
4. කළුගල හේවාගේ ගාමිණී මහතා - ප්‍රා.ස.ස. - සාමාජික
5. මද්දගේ ජගත් විමලසිරි මහතා - ප්‍රා.ස.ස. - සාමාජික
6. සංජේ එරංග කරවිට මහතා - ප්‍රා.ස.ස. - සාමාජික
7. අබ්දුල් හමීඩ් මොහොමට් රම්සාන් මහතා - ප්‍රා.ස.ස. - සාමාජික
8. චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය - ප්‍රා.ස.ස - සාමාජික
9. කේ.ඒ. තිලිණි මධුෂාණි සිරිවර්ධන මහත්මිය - ප්‍රා.ස.ස. - සාමාජික

ගරු ප්‍රාදේශීය සභා සභික තුඩුගලගේ දොන් රෝහිත මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**තීරණය - ඒකමතිකව සහා සම්මත විය.**

10 **යෝජනාව**

**ටෙන්ඩර් කාරක සභාවක්** පිහිටුවිමට ගරු සභාවට යෝජනා කරමි.

ප්‍රාදේශීය සභාවේ මුල්‍ය හා පරිපාලන රීති 314 සහ 411 දක්වා ක්‍රියා කිරිමට සභාවේ දේපල බදු දිම කුලියට දිම විකිණීමට අදාල ටෙන්ඩර් ක්‍රියාවලිය (ලංසුපත් විවෘත කිරිම ඇතුලත්ව) සඳහා අස්තිත්වය වශයෙන් ක්‍රියා කිරිමට පහත සාමාජිකයින්ගෙන් යුක්ත විය යුතු යැයි සභාවට යෝජනා කරමි.

1. කසුන් මුණසිංහ මහතා - සභාපති
2. නෙලු නිශාන්ති ඉද්දගොඩ මහත්මිය - සාමාජික
3. ප.පා.ස.කො.කාර්යාලයේ නිලධාරි වයි.ඩී. ප්‍රේමලතා මහත්මිය- සාමාජික
4. පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි - ප්‍රා.ස.ස. - සාමාජික
5. ටී. විජිතා දර්ශනි කුමාරි ද සිල්වා මහත්මිය - ප්‍රා.ස.ස. - සාමාජික

ටෙන්ඩර් කමිටු ලේකම් ලෙස ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි (ආදායම්) අරුණ බුද්ධික ජිනදාස මහතා පත්කිරිම.

ගරු ප්‍රාදේශීය සභා සභික අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**තීරණය - ඒකමතිකව සහා සම්මත විය.**

11 **යෝජනව**

**ටෙන්ඩර් ඇගයිම් කමිටු** පිහිටුවිමට ගරු සභාවට යෝජනා කරමි.

i. කේ.කේ.ඩී.ආර්. සංජීව මහතා - සාමාජික
ii. ජී.ඒ.එස්. මධුවන්ති මහත්මිය - සාමාජික
iii. ආර්.ඩී.ජී. කාවින්ද මහතා - සාමාජික

ගරු ප්‍රාදේශීය සභා සභික චන්දිමා රුවනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**තීරණය - ඒකමතිකව සහා සම්මත විය.**

**12** **යෝජනාව**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා විසින් සංශෝධිත යෝජනාව**

භාණ්ඩ වැඩ හා සේවා තොරතුරු පද්ධති සැපයිම සඳහා (ලංසුපත් විවෘත කිරිම ඇතුලත්ව) පහත සඳහන් සාමාජිකයින්ගෙන් යුක්තව **ප්‍රසම්පාදන කමිටු** පත්කිරිම විය යුතු යැයි සභාවට යෝජනා කරමි.

i. කසුන් මුණසිංහ මහතා - ප්‍රා.ස. සභාපති - සභාපති
ii. අනගිපුර සමන්ත රෝහන මහතා -ප්‍රා.ස.උ. සභාපති - සාමාජික
iii. ඩබ්.ඒ. ඔෂධි ධනංජනා මහත්මිය - ප්‍රා.ස.ස - සාමාජික
iv. කේ.කේ. කාවිද්‍යා ඉඳුවරනි මහත්මිය -ප්‍රා.ස.ස. - සාමාජික
v. ආර්.එම්. රුවන්ති වාසනා රත්නායක මහතාමිය - ප්‍රා.ස.ස. - සාමාජික
vi. ජේ.ඒ. දර්ශන ශ්‍රී සම්පත් මහතා - ප්‍රා.ස.ස. - සාමාජික
vii. කේ.ඒ. තිලිණි මධුෂාණි සිරිවර්ධන මහත්මිය - ප්‍රා.ස.ස. - සාමාජික
viii. ඩී.සී.ආර්. දුමිදු චතුර සම්පත් මහතා - ප්‍රා.ස.ස. - සාමාජික
ix. තොටගමගේ නිහාල් මහතා - ප්‍රා.ස.ස. - සාමාජික

ගරු ප්‍රාදේශීය සභා සභික චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් මෙම සංශෝධිත යෝජනාව ස්ථිර කරන ලදී.

**තීරණය - ඒකමතිකව සභා සම්මත විය.**

13 **යෝජනාව**

**ප්‍රසම්පාදන ඇගයිම් කමිටු** පිහිටුවිමට ගරු සභාවට යෝජනා කරමි.

i. කේ.කේ.ඩී.ආර්. සංජීව මහතා - සාමාජික
ii. ජී.ඒ.එස්. මධුවන්ති මහත්මිය - සාමාජික
iii. ආර්.ඩී.ජී. කාවින්ද මහතා - සාමාජික

මෙහිදි විශේෂඥ දැනුම අවශ්‍ය වුවහොත් ඒ සම්බන්ධ දැනුම ඇති අයෙකු සහභාගි කරවාගෙන ඉදිරි කටයුතු කිරිමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

ගරු ප්‍රාදේශීය සභා සභික තිළිණි මධුෂානි මහත්මිය විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**තීරණය - ඒකමතිකව සභා සම්මත විය.**

**න්‍යාය පත්‍රානුකූලව මෙදින නියමිත කටයුතු අවසන් විමෙන් පසුව මහ සභාවේ කටයුතු පෙ.ව. 11.20ට පමණ අවසන් විය.**